# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2080/17 - 2018 ජූලි මස 16 වැනි සඳුදා - 2018.07.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : HDS/LND/14/F/4.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත සඳහන් ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/ පරවශතාවේ විස්තර*:

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිරිබෝපුර ගමේ අංක 90 සිරිබෝපුර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවෙන් හම්බන්තොට කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අවසන් හු ලක්ෂණාත්මක පිඹුරු අංක 4 හි අතිරේක අංක 288 පත්‍ර අංක 661 වශයෙන් පෙන්වා ඇති මුළු ප්‍රමාණය හෙක්. 0.0054 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස;

**01. කැබලි අංක E 3643**

ඉඩමේ නමඃ සිරිබෝපුර කැලේ ; විස්තරය: මාර්ගය ; හිමිකම් කියන අය: එගොඩහේවාගේ ගුණවතී, අංක 126, සිරිබෝපුර, හම්බන්තොට. B 2567 සහ B 2568 වැනි බිම් කැබැල්ලේ කොටසකි. සිරිබෝපුර ගුවන් පාලම ඉදිකිරීම සඳහා අවශ්‍ය වී ඇත; ප්‍රමාණය: හෙක්. 0.0054.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2018 අගෝස්තු මස 29 වැනි දින පෙ.ව. 09.30 ට හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ වියයුතුයි.

තව ද 2018 අගෝස්තු මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම පරවශ්‍යතාව ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඊ.කේ.ඒ. සුනීතා,
ප්‍රාදේශීය ලේකම්,
හම්බන්තොට.

2018 ජූලි මස 04 වැනි දින,
හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-32

ශුද්ධි පත්‍රයයි

*යොමු අංකය* : DSWE/LND/2/F1/40

1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වැනි වගන්තිය යටතේ 2017 දෙසැම්බර් මස 14 වැනි දින අංක 2049/28 දරන ශ්‍රී ලංකා ජන රජයේ *ගැසට් පත්‍රයේ* 111 වන කොටසේ පළකරන ලද මගේ යොමු අංක DSWE/LND/2/F1/40 හා 2017 නොවැම්බර් මස 20 වැනි දරන දැන්වීමේ සඳහන් පරීක්ෂණ දිනය සහ වේලාව ද, වන්දි ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු දිනය ද පහත සඳහන් පරිදි සංශෝධනය කරමි.

9 වගන්තිය හිමිකම් පරීක්ෂණ
*දිනය සහ වේලාව* : 2018.09.17 වැනි දින උදේ 09.30 ට.
වන්දි ඉල්ලුම් පත්‍ර ඉදිරිපත්
කළයුතු දිනය 2018.09.10 දින ට පෙර.

කුමුදු සී. ලොකුහේවාගම,
ප්‍රාදේශීය ලේකම්,
වීරකැටිය.

2018 ජුනි මස 28 වැනි දින,
වීරකැටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

08-33

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.